# නූර්ති ගීත රංගනය සමඟ ගායනය කරමින් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරමු.

- නූර්ති ගීත ගායනය සමඟින් ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට රංගන හැකියාව තිබිය යුතුමද? නැත .
- නූර්ති නාට්‍ය යනු රංගනයට වඩා සංගීතයට මූලිකත්වය දුන් නාට්‍ය විශේෂයකි. එම නිසා 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඔබට පුංචි රංගනයක යෙදෙමින් නූර්ති ගීතයක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ හැකි දෙයකි.
- නළුවා විසින්ම ගායනය කිරීම ද තවත් ලක්ෂණයකි.
- ඔබ සතර අභිනය ගැන අසා තිබෙනවාද?රංග කලාව බිහිවන්නේ සතර අභිනය මූලික කරගනිමින් ය.
- රංගනය සඳහා සතර අභිනය අනිවාර්යෙන්ම දැනගෙන ඉන්න අවශ්‍යම වෙනවා.

## සතර අභිනය

1. ආංගික අභිනය
2. වාචික අභිනය
3. සාත්වික අභිනය
4. ආහාර්ය අභිනය

ආංගික අභිනය යනු ශරීරයේ අංග චලන වලින් රංගනයේ යෙදීමයි. ඉතින් දරුවනේ නූර්ති නාට්‍ය සඳහා සංකීර්ණ අංග චලන අවශ්‍ය වන්නේ නැහැ. ගීතයේ අදහසට ගැලපෙන සුලු අංග චලන පමණක් ප්‍රමාණවත් වෙනවා.

වාචික අභිනය යනු දෙබස් සහ ගීතයි. ගායනයත් වාචික අභිනයේම කොටසකි.

සාත්වික අභිනය යනු මුහුණෙන් කරනු ලබන ඉදිරිපතත් කිරිමයි. දුක,සතුට,බය,පුදුමය වැනි දේ මුහුණෙන් පෙන්වීම 6 ශ්‍රේණයේ ඔබට ඉතා පහසු කාර්යයකි.

ආහාර්ය අභිනය යනු වේදිකා පසුතල වැනි දෑයි.ඔබට පුහුණුවීම් කටයුතු වලදී මෙම අභිනය වැදගත් නොවන අභිනයක් ලෙස දැක්විය හැකිය. නමුත් ප්‍රසංගයකදී , නාට්‍යකදී මෙම අභිනය ඉතා වැදගත් වේ.

ඉතින් දරුවනේ ඉහත දක්වා ඇති සතර අභිනය පිළිබඳ තොරතුරු හොඳින් අධ්‍යයනය කර ගීතය ගයමින් මුහුණෙන් හැඟීම් ඉදිරිපත් කරමින් ගීතයට උචිත අංග චලනද සමඟින් ගීතය ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට හුරුවන්න. වැඩිහිටියෙකුගේ උපකාරය ඇතිව YouTube වෙබ් පිටුවට ගොස් නූර්ති ගීත ප්‍රාසාංගිකව ඉදිරිපත් කරන වීඩියෝ නරඹා රසවින්දනය කරන්න.